# ඉතිහාසය

## අ.පො.ස (උ.පෙළ) විෂය නිර්දේශය
## 12,13 ශ්‍රේණි

(2017 සිට ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

## හැඳින්වීම

2017 නව විෂයමාලා සංශෝධන යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ නිභාගයට අදාළ ඉතිහාසය විෂය නිර්දෙශය කොටස් සතරකින් සමන්විත වේ.

- ශ්‍රී ලංකාව් ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා)
- ඉන්දියාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට බ්‍රිතාව්‍ය පාලනය අවසානය දත්වා)
- යුරෝපා ඉතිහාසය (ග්‍රීක,රෝම ශිෂ්ටාචාර අවදියේ සිට 1989 දක්වා)
- නූතන ලෝක ඉතිහාසය (ක්‍රි.ව 1500 සිට ක්‍රි.ව 1989 දක්වා)

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය දෙස බලන විට අතීතයේ සිට හුදකලාව වර්ධනය වුවක් නොව විවිධ ගෝලීය බලපෑම් මත දේශියකරණය වෙමින් පෝෂණය වී වර්ධනය වූ බව පෙනේ.එවැනි ප්‍රවණථා හා බලපෑම් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉතිහාසය සමග ඉන්දියාවේ ඉතිහාසය, යුරෝපා ඉතිහාසය, නූතන ලෝක ඉතිහාසය යන විෂය නිර්දේශ ද අ.පො.ස (උ.පෙළ) ඉතිහාසය සඳහා එක්කර ඇත.

අ.පො.ස (උ.පෙළ) සඳහා ඉතිහාසය විෂයමාලාව තෝරා ගන්නා ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාව් ඉතිහාසය විෂය නිර්දේශය අනිවාර්ය වේ. ඉන්දියාවේ ඉතිහාසය, යුරෝපා ඉතිහාසය, නූතන ලෝක ඉතිහාසය යන විෂය කාණ්ඩ අතුරින් එක් විෂය කාණ්ඩයක් පමණක් තම අභිමතය පරිදි තෝරා ගත යුතුය.

2017 දී ක්‍රියාත්මක වීමට නියමිත මෙම විෂය නිර්දේශයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ විෂය අන්තර්ගතයේ අරමුණු කරා යාම වඩාත් පහසු කිරීම සඳහා ඉගෙනුම් පල සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේදී ඊට අනුකූලනය වූ ගෝලීය ප්‍රවණතා අදනා ගැනීම සහ මෑත කාලයේ සිදුකළ ඉතිහාස පර්යේෂණ අනාවරණ ඇසුරින් එක් එක් විෂය නිර්දේශයන්හ අන්තර්ගතයේ සංශෝධන කිහිපයක් සිදු කර ඇත.

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඃ**

- පැරණි නිර්දේශයට වඩා වැඩි අවධානයක් ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ ව අවධානය යොමු කිරීම
- මූලාශ්‍රය වර්ග කිරීමේ දී වර්තමාන නිර්දේශ යොදා ගැනීම
- " අපේ පැරණි තාක්ෂණය" නව විෂය නිර්දේශයට එකතු කිරීම

**ඉන්දියාවේ ඉතිහාසය ඃ**

- පැරණි නිර්දේශයට අනුව ක්‍රි.ව 1206 දක්වා පමණක් අවධානය යොමු කර තිබූ අතර එය නව නිර්දේශයෙහි ඉන්දියාව නිදහස දිනා ගැනීම දක්වා දීර්ඝ කර ඇත.
- සම්පූර්ණ ඉන්දියා ඉතිහාසයට වඩා ශ්‍රී ලංකාවට බලපෑමක් එල්ල වූ සිදුවීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම

**යුරෝපා ඉතිහාසය ඃ**

- ගෝලීය වශයෙන් බලපෑමක් වූ ගෝඨික බලවේග පිළිබඳ අවධානය යොමු කර ඇත.

**නූතන ලෝක ඉතිහාසය ඃ**

- ලෝකයේ සිදු වූ ගෝලීය ප්‍රවණතා පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම විෂය නිර්දේශය 12 සහ 13 ශ්‍රේ ණි සඳහා වූවකි. ඒ අනුව විෂය අන්තර්ගතය එක් එක් ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීමට සංවිධානය කර ගත යුතු වේ.

# පටුන

| | පිටුව |
|---|---|
| හැඳින්වීම | i - ii |
| පටුන | iii |
| ජාතික අරමුණු | iv |
| මූලික නිපුණතා | v - vii |
| ඉතිහාසය විෂයයේ අරමුණු | viii |
| ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | ix |
| වාර සඳහා යෝජිත නිපුණතා මට්ටම් | x |
| විෂය නිර්දේශය | 1 - 50 |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | 51 |
| ඇගයීම සහ තක්සේරුකරණය | 52 |
| විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | 53 - 54 |

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය තෙක් වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දෑහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| විෂය අරමුණ | ජාතික පොදු අරමුණ | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම | √ | √ | | | | | √ | |
| 2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම | √ | √ | √ | | | √ | √ | |
| 3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම | √ | √ | √ | | | | | √ |
| 4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම | √ | √ | √ | | | | | |
| 5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම | √ | √ | √ | | | | | |
| 6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම | | | | | √ | | | |
| 7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම | | | | | √ | | | |
| 8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම | √ | √ | √ | | | | √ | |
| 9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම | | √ | | | | | | |
| 10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම | | √ | | | | | | |

## වාර සඳහා යෝජිත නිපුණතා මට්ටම්

| ශ්‍රේණිය සහ වාරය | | ශ්‍රී ලංකාවේ ඉතිහාසය | ඉන්දියාවේ ඉතිහාසය | යුරෝපා ඉතිහාසය | නූතන ලෝක ඉතිහාසය |
|---|---|---|---|---|---|
| 12 ශ්‍රේණිය | 1 වාරය | 1.1, 2.1, 3.1, 4.1, 5.1 | 1.1, 2.1, 3.1 | 1.1, 2.1, | 1.1, 2.1 |
| | 2 වාරය | 5.2 | 4.1, 5.1 | 2.2, 3.1, 4.1 | 3.1, 4.1 |
| | 3 වාරය | 6.1 | 5.1, 6.1 | 5.1, 6.1, 7.1 | 5.1, 6.1, 7.1 |
| 13 ශ්‍රේණිය | 1 වාරය | 7.1, 8.1 | 7.1, 8.1, (මුල් කොටස් දෙක) | 8.1, 9.1, 10.1 | 8.1, 9.1 |
| | 2 වාරය | 9.1, 10.1 | 8.1(දෙවන කොටස), 9.1 | 11.1, 12.1, 13.1 | 10.1 |
| | 3 වාරය | 11.1 | 10.1, 11.1 | 13.2, 14.1 | 11.1, 12.1 |

# විෂය නිර්දේශය

*12 වන ශ්‍රේණිය*

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඓතිහාසික හර පද්ධති හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජිවිතයට ආදේශ කර ගනියි | 1.1 ඉතිහාසය යනු කුමක් දැයි පැහැදිලි කරයි<br>1.2 ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙයි | 1. ඉතිහාසය හැඳින්වීම<br>• ඉතිහාසය අර්ථකථනය<br>• ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන | • ඉතිහාසය පිළිබඳ අර්ථකථන රැස් කරයි<br>• ඉතිහාස විෂයය සඳහා අර්ථකථනයක් ගොඩනගයි<br>• ඉතිහාසය හැදෑරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන විස්තර කරයි<br>• ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම අගයමින් කථා කරයි | 07 |
| කාලය හා අවකාශය පදනම් කරගෙන ශිෂ්ටාචාර විකාශනය වන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 1.3 ඉතිහාසය අධ්‍යයනය කළ යුතු කාල රාමුව හා අවකාශය පැහැදිලි කරයි | • අධ්‍යයන කාලය<br>- ප්‍රාග් ඓතිහාසින යුගයේ සිට ක්‍රි.ව 1978 දක්වා | • ඉතිහාස විෂයය සඳහා වූ අධ්‍යයන කාල පරාසය පෙන්වාදෙයි<br>• ඉගෙනීමේ පහසුව සඳහා කාල පරාසය වර්ග කර දක්වයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **රටක ඉතිහාසය ගොඩනැගීමේ දී භූගෝලීය සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | **2.1 ලංකා ඉතිහාසයේ අධ්‍යයනය කළ යුතු අවකාශය පිළිබඳ පැහැදිලි කරයි**<br><br>**2.2 භූගෝලීය පිහිටීම ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විමර්ශනය කරයි** | 2. අවකාශය<br>• අර්ධශුෂ්ක කලාපය<br>• මධ්‍යම කඳුකරය<br>• වෙරළබඩ තැන්න<br><br>• භූගෝලීය පිහිටීම හා මානව හැසිරීම<br>- ඉන්දියාවට ආසන්න ව පිහිටීම<br>- ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම<br>- ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම<br><br>• අභ්‍යන්තර භූගෝලීය සාධක<br>- කඳු, ගංගා, තැනිතලා, වරාය මානව හැසිරීම කෙරෙහි ඇති කළ බලපෑම<br>සම්පත් විසරණය හා මානව ක්‍රියාවන් අතර බද්ධතා | • ලංකා ඉතිහාසයේ අධ්‍යයනය කළ යුතු අවකාශය පෙන්වා දෙයි<br>• ලංකා ඉතිහාසයේ අධ්‍යයනය කළ යුතු ප්‍රදේශ සිතියමක ලකුණු කරයි<br><br>• ශ්‍රී ලංකාවේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම විස්තර කරයි<br>• භූගෝලීය විෂමතා මානව සබඳතා කෙරෙහි බලපෑම පෙන්වා දෙයි<br>• ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සිතියමක ලකුණු කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| මූලාශ්‍රය විශ්ලේෂණයෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි | 3.1 ඉතිහාසය ගොඩනැඟීමට දායක වන මූලාශ්‍රය විමසා බලයි | **3. මූලාශ්‍රය විභාගය හා විචාරය**<br>• ශ්‍රී ලාංකේය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය<br>- මූලාශ්‍රය වර්ගීකරණය<br>* සාහිත්‍ය මූලාශ්‍රය<br>* පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය<br>* අභිලේඛන<br>* නාණක<br>* ජනප්‍රවාද හා පුරාවෘත්ත | • ඉතිහාසය ගොඩනැඟීමට දායකවන මූලාශ්‍රය නම් කරයි<br>• මූලාශයවල ස්වභාවය අනුව ඒවා වර්ග කරයි<br>• මූලාශ්‍රය වර්ගය අනුව ඓතිහාසික කරුණු ගොඩනගාගත හැකි ආකාරය පැහැදිලි කරයි | 18 |
| | 3.2 මූලාශ්‍රය විශ්ලේෂණයෙන් ඓතිහාසික කරුණු ගොඩනගන ආකාරය පෙන්වා දෙයි | • මූලාශ්‍රය විචාරශීලී ව විමසීම | • මූලාශ්‍රය විචාරශීලී ව විමර්ශනය කරයි<br>• මූලාශ්‍රය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි | | 4. ජනාවාසවල ආරම්භය හා ව්‍යාප්තිය (ක්‍රි.පූ තුන් වන සියවස අවසානය තෙක්) | • ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධිය පැහැදිලි කරයි<br>• ඉතා පැරණි කාලයේ සිට ශ්‍රී ලංකාවේ ජනාවාස තිබූ බව අගය කරයි<br>• ප්‍රාග් ඓතිහාසික ජනාවාස සිතියමක ලකුණු කරයි | 20 |
| | 4.1 ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි | • ප්‍රාග් ඓතිහාසික අවධිය | | |
| | 4.2 පූර්ව ඓතිහාසික යුගයේ මානව ක්‍රියාකාරිත්වය පිළිබඳ ව සොයා බලයි | • පූර්ව ඓතිහාසික අවධිය | • පූර්ව ඓතිහාසික අවධිය පැහැදිලි කරයි<br>• පූර්ව ඓතිහාසික යුගයේ දියුණුව අගයයි<br>• පූර්ව ඓතිහාසික යුගයට අයත් ස්ථාන සිතියමක ලකුණු කරයි | |
| | 4.3 ඓතිහාසික යුගය හා එහි ජනාවාස පිළිබඳ ව විමර්ශනය කරයි | • ඓතිහාසික යුගය<br>- ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් ජන කණ්ඩායම් පැමිණීම | • ඓතිහාසික යුගය පැහැදිලි කරයි<br>• ඓතිහාසික යුගය ජනාවාස වූ ආකාරය විස්තර කරයි<br>• ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක ලකුණු කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි | 5.1 රජරට ශිෂ්ටාචාරයේ තාක්ෂණික පදනම හඳුන්වා දෙයි | 5. රජරට ශිෂ්ටාචාරය (පොළොන්නරුව අවසානය තෙක්)<br><br>• රජරට ශිෂ්ටාචාරයේ පදනම පිළිබඳ හැඳින්වීම | • රජරට ශිෂ්ටාචාරයේ පදනම පහදයි<br>• රජරට ශිෂ්ටාචාරයේ දියුණුවට එහි පදනම දායක වූ ආකාරය පහදයි<br>• රජරට ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි | 100 |
| | 5.2 රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා තාක්ෂණය විස්තර කරයි | • රජරට ශිෂ්ටාචාරයේ f oaYmd, k , ආර්ථික, සමාජ, සංස්කෘතික සහ තාක්ෂණික කටයුතු<br>- දේශපාලන<br>* රාජ්‍ය පාලකයෝ<br>* පාලන තන්ත්‍ර<br>* යුද්ධෝපක්‍රම<br>* විදේශ සම්බන්ධතා<br><br>- ආගම හා සංස්කෘතිය<br>* බුදු දහම පිහිටුවීම හා<br>* ව්‍යාප්තිය<br>* වෙනත් ආගම්<br>* කලාව හා සංස්කෘතිය | • රජරට ශිෂ්ටාචාරයේ පදනම ශක්තිමත් කිරීමට දායක වූ රජවරුන් පෙන්වා දෙයි<br><br>• රජරට ශිෂ්ටාචාරයේ සංවර්ධනය අගය කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ආර්ථිකය<br>- කෘෂිකර්මාන්තය<br>- කර්මාන්ත<br>- වෙළෙඳාම<br><br>• සමාජය<br><br>• විද්‍යාව හා තාක්ෂණය<br>- වාරි තාක්ෂණය<br>- වාස්තු විද්‍යාව<br>- වෛද්‍ය විද්‍යාව<br>- ලෝහායනය | • රජරට ශිෂ්ටාචාරයේ ඓතිහාසික ස්ථාන වැව් අමුණු සිතියමක ලකුණු කරයි | |
| | 5.3 රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමෙන් එහි පරිහානිය හා බිඳවැටීම සිදු වන ආකාරය පෙන්වා දෙයි | • රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳවැටීම | • රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමට හේතු දක්වයි<br><br>• රජරට ශිෂ්ටාචාරයේ බිඳවැටීම සිදුවූ ආකාරය පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි | 6.1 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය මුල් පදනමින් වෙනස් වූ අවදියක් වෙත පිවිසීම හා එහි ක්‍රියාකාරිත්වය විමර්ශනය කරයි | 6. රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවදිය<br>• පාලන මධ්‍යස්ථාන<br>- හැඳින්වීම<br>- දඹදෙණිය, යාපහුව,කුරුණෑගල ගම්පොළ<br>- විදේශ සම්බන්ධතා ආගම, සංස්කෘතිය හා සමාජය | • පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි හඳුන්වාදෙයි<br>• රජරට රාජධානි හා පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි අතර වෙනස පහදයි<br>• පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි සිතියමක ලකුණු කරයි | 50 |
| | 6.2 යාපනය රාජධානිය පිළිබඳ ව විමර්ශනය කරයි | • යාපනය රාජධානිය | • යාපනය රාජධානියේ ආරම්භය හා වර්ධනය විස්තර කරයි<br>• යාපනය රාජධානියේ පරිහානිය විස්තර කරයි | |
| | 6.3 කෝට්ටේ රාජධානිය පිළිබඳ ව විමර්ශනය කරයි | • කෝට්ටේ රාජධානිය | • කෝට්ටේ රාජධානියේ ආරම්භය හා වර්ධනය පැහැදිලි කරයි<br>• කෝට්ටේ රාජධානියේ විශිෂ්ට රජවරුන් අගය කරයි<br>• කෝට්ටේ රාජධානියේ පරිහානිය විස්තර කරයි | |

*12 වන ශ්‍රේණිය*

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| කාලානුපිළිවෙළ, මූලාශ්‍රය හා විවේචනය හා හේතු ඵල සම්බන්ධය ඇසුරින් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි | 1.1 ඉන්දියා ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය විග්‍රහ කරයි | 1. මූලාශ්‍රය විභාගය හා විචාරය<br>• ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය<br>• මූලාශ්‍රය වර්ගීකරණය<br>• මූලාශ්‍රය භාවිතයේ දී පැන නඟින අභියෝග<br>• මූලාශ්‍රය පිළිබඳ විවේචන<br>• මූලාශ්‍රය සංසන්දනාත්මක අධ්‍යයනයේ වැදගත්කම | • ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය නම් කරයි<br>• ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය වර්ග කරයි<br>• ඉන්දීය ඉතිහාසය ගොඩනැගීමේ දී මූලාශ්‍රය උපයෝගී කරගන්නා ආකාරය පැහැදිලි කරයි | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **රටක ඉතිහාසය ගොඩනැගීමේ දී භෞතික සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | **2.1 භූගෝලීය පිහිටීම ඉන්දියා ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විමර්ශනය කරයි** | **2. භූගෝලීය සාධක ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑම**<br>• භූගෝලීය පිහිටීම<br>- බාහිර පිහිටීම<br>- අභ්‍යන්තර පිහිටීම<br>• භූගෝලීය සාධක ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑම<br>• ඉන්දියාවේ විශාලත්වය සහ විවිධත්වය | • ඉන්දියාවේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම විස්තර කරයි<br>• ඉන්දියාවේ පිහිටීම දේශීය හා විදේශීය මානව සබඳතා කෙරෙහි බලපෑම පෙන්වා දෙයි<br>• ඉන්දියාවේ භෞතික ලක්ෂණ සිතියමක ලකුණු කරයි | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | **3.1 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි ආරම්භය, වර්ධනය හා පරිහානිය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි** | **3. සින්ධු නදිය කේන්ද්‍රකොට බිහි වූ නාගරික ශිෂ්ටාචාරය**<br>• හරප්පා ශිෂ්ටාචාරය හැඳින්වීම<br>• ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ ව ඇති මතවාද හා සමකාලීන වෙනත් ශිෂ්ටාචාර අතර සබඳතා<br>• නාගරික සැලසුම<br>• සමාජ, ආර්ථික හා ආගමික තත්ත්වය<br>• කලාත්මක හැකියා<br>• පරිහානිය හා ඒ පිළිබඳ විචාරක මත | • හරප්පා ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විස්තර කරයි<br>• හරප්පා ශිෂ්ටාචාරයෙහි විශිෂ්ටත්වය අගය කරයි<br>• හරප්පා ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කරයි | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි** | **4.1වෛදික යුගය පිළිබඳ තොරතුරු විස්තර කරයි** | **4. ගංගා නිම්න ඔස්සේ පැතිර ගිය මානව ජනාවාස රටාව**<br>• ඍග් වෛදික සාහිත්‍යයෙන් අනාවරණය වන මානව ව්‍යාප්තියේ ස්වරූපය<br>• ඍග් වෛදික යුගයේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික රටාව<br>• පශ්චාද් වෛදික ජනාවාස ව්‍යාප්තිය<br>• පශ්චාද් වෛදික යුගයේ දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික වර්ධනය | • වෛදික යුගය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>• වෛදික යුගය ඉන්දීය ශිෂ්ටාචාරයේ පදනම බවට තොරතුරු ඉදිරිපත් කරයි<br>• ඍග් වෛදික හා පශ්චාද් වෛදික ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 5.1 සොළොස් මහා ජනපද ව්‍යාප්තිය විස්තර කරයි | 5. දේශපාලන හා මානව චින්තාවලියේ වර්ධනය<br>• ජනපද ව්‍යාප්තිය හා සොළොස් මහා ජනපද | • සොළොස් මහා ජනපද පිළිබඳ විස්තර කරයි<br>• සොළොස් මහා ජනපදවල බලවත් රාජ්‍ය පෙන්වා දෙයි<br>• සොළොස් මහා ජනපද සිතියමක ලකුණු කරයි | 25 |
| | 5.2 ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරය ගොඩ නැඟීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි | • ආගමික චින්තනයේ වර්ධනය<br>- සංස්කෘතික වෙනස්කම් නව ආගමික චින්තාව බිහි වීම හා ව්‍යාප්තිය<br>- දේශපාලන හා නව ආගමික චින්තාවන්හි බලපෑම මත වෙනස්වන මානව හැසිරීම් හා ක්‍රියාකාරකම් | • ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තාවන් විස්තර කරයි<br>• නව ආගමික චින්තාවන් දේශපාලනය කෙරෙහි බලපෑම පෙන්වා දෙයි<br>• නව ආගමික චින්තාවන් මානව සමාජය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි** | **6.1 අධිරාජ්‍යවාදී සංකල්පය මෞර්ය අධිරාජ්‍යය ඇසුරින් පැහැදිලි කරයි** | **6. අධිරාජ්‍යවාදී සංකල්පය හා මෞර්ය අධිරාජ්‍යය**<br>• පාලන සංකල්පවල වර්ධනය හා අධිරාජ්‍යවාදී සංකල්පය<br>• මෞර්ය අධිරාජ්‍යයේ වර්ධනය<br>• අශෝක හා ඔහුගේ ප්‍රතිපත්ති<br>• මෞර්යන් යටතේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ප්‍රවණතා<br>• මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා හේතු | • අධිරාජ්‍යවාදී සංකල්පය විස්තර කරයි<br>• ශක්තිමත් මෞර්ය අධිරාජ්‍යයක් ගොඩ නැගූ ආකාරය පැහැදිලි කරයි<br>• අධිරාජ්‍යයක පවතින සුවිශේෂ ලක්ෂණ මෞර්ය පාලනය ඇසුරින් විස්තර කරයි<br>• මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට හේතු දක්වයි<br>• මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | 30 |

*12 වන ශ්‍රේණිය*

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| විවිධ බලවේග මුල් කර ගනිමින් ශිෂ්ටාචාර ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි | 1.1 නූතන යුරෝපය උදා වූ ආකාරය පැහැදිලි කරයි | **1. යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම**<br>• ග්‍රීක, රෝම සහ ක්‍රිස්තියානි ප්‍රභවයන්<br>• ඉස්ලාම් ව්‍යාප්තිය<br>• වැඩවසම් ක්‍රමයේ පරිහානිය<br>• කුරුස යුද්ධ<br>• වෙළෙඳාමේ දියුණුව<br>• නගර වර්ධනය<br>• මධ්‍යම පන්තියේ නැගීම | • යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම විග්‍රහ කරයි<br>• නූතන යුරෝපා ශිෂ්ටාචාරය හැඩගැස්වීමට ග්‍රීක, රෝම හා ක්‍රිස්තියානි බලවේග බලපෑ ආකාරය පෙන්වා දෙයි<br>• වැඩවසම් ක්‍රමයේ පරිහානිය නූතන යුරෝපයේ ආරක්ෂාවට තුඩු දුන් ආකාරය පැහැදිලි කරයි<br>• ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ශිෂ්ටාචාර ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| .යුරෝපයේ සිදු වූ වෙනස් වීම් ලෝකය කෙරෙහි බලපෑ ආකාරය පෙන්වා දෙයි | 2.1 යුරෝපය නූතන යුගයට අවතීර්ණ වූ ආකාරය විග්‍රහ කරයි | 2. නූතන යුරෝපයේ ආරම්භය<br>● පුනරුදය හා බුද්ධි ප්‍රබෝධය<br>● විද්‍යාත්මක සොයා ගැනීම්<br>● ජාතික රාජ්‍යවල නැගීම | ● පුනරුදය විග්‍රහ කරයි<br>● නව ප්‍රවණතා මගින් යුරෝපය නූතන යුගයට පැමිණි ආකාරය පෙන්වා දෙයි | 30 |
| | 2.2 යුරෝපා රටවල් වෙනත් මහාද්වීපවල අධිරාජ්‍ය ගොඩනැගූ ආකාරය පරීක්ෂා කරයි | ● දේශ ගවේෂණ<br>● යුරෝපීය ව්‍යාප්තිය | ● දේශ ගවේෂණ විස්තර කරයි<br>● යුරෝපයේ ව්‍යාප්තිය සෙසු රටවලට බලපෑ අයුරු විග්‍රහ කරයි<br>● දේශ ගවේෂණ හා යුරෝපීය ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ආගමික ක්ෂේත්‍රයේ සිදු වන වෙනස් වීම් සමාජයේ සෙසු ක්ෂේත්‍ර කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගෙන වෙනස් වීම්වලට මුහුණ දීමේ ආකල්ප වර්ධනය කර ගනියි | 3.1 යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ඇති වීමට තුඩු දුන් හේතු විග්‍රහ කරයි | 3. ආගමික ප්‍රතිසංස්කරණ හා ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය<br>● ආගමික ප්‍රතිසංස්කරණවල පසුබිම | ● ආගමික ප්‍රතිසංස්කරණවලට තුඩු දුන් පසුබිම විස්තර කරයි<br>● ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල පෙන්වා දෙයි<br>● ආගමික ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ රටවල් සිතියමක ලකුණු කරයි | 25 |
| | 3.2 රෙපරමාදු හා ප්‍රති රෙපරමාදු ව්‍යාපාරවල ප්‍රතිඵල පිරික්සයි | ● රෙපරමාදු ව්‍යාපාරය<br>● ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය | ● රෙපරමාදු හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය පැහැදිලි කරයි<br>● ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රතිඵල විග්‍රහ කරයි<br>● රෝමානු කතෝලික හා රෙපරමාදු ආගම්වල ව්‍යාප්තිය යුරෝපයේ සිතියමක ලකුණු කරයි | |
| | 3.3 ආගම මුල් කරගෙන යුරෝපයේ ඇති වූ ගැටුම් විමර්ශනය කරයි | ● තිස් අවුරුදු යුද්ධය<br>- යුද්ධයේ ප්‍රධාන අවස්ථා<br>- වෙස්ට්පේලියා ගිවිසුම | ● තිස් අවුරුදු යුද්ධය පැහැදිලි කරයි<br>● තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල පෙන්වා දෙයි<br>● තිස් අවුරුදු යුද්ධය අවසානයේ යුරෝපය සිතියමක ලකුණු කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| පාර්ලිමේන්තු ක්‍රමයේ බලය වර්ධනය මානව සංහතියේ ප්‍රගමනයට දායක වූ අයුරු විග්‍රහ කරයි | 4.1 බ්‍රිතාන්‍ය සමාජයේ ඇති වූ වෙනස් වීම්වලට අනුරූප ව දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රවණතා විමර්ශනය කරයි<br><br>4.2 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඇසුරින් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරයි | 4.බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය<br>● පාර්ලිමේන්තුවේ ආරම්භය හා වර්ධනය<br><br>● පාර්ලිමේන්තු ක්‍රමයේ ලක්ෂණ<br>- නියෝජන ක්‍රමය<br>- පක්ෂ ක්‍රමය<br>- කැබිනට් ක්‍රමය | ● ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්වීම්වලට සාපේක්ෂ ව දේශපාලන ක්ෂෙත්‍රයේ වූ ප්‍රවණතා පෙන්වා දෙයි<br><br>● බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරයි<br>● නියෝජන පාර්ලිමේන්තු ක්‍රමය මානව සංහතියේ ප්‍රගමනයට දායක වන ආකාරය පෙන්වා දෙයි<br>● නියෝජන ක්‍රමය, පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඇසුරින් විග්‍රහ කරයි | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ස්වාභාවික අභියෝගවලට මුහුණ දීමේ දී මිනිසා අත්පත් කරගත් ජයග්‍රහණ තුලනාත්මක ව අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි | 5.1 ලෝකයේ ගමන් මග වෙනස් කිරීමට කාර්මික විප්ලවය බලපෑ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි | 5. කාර්මික විප්ලවය<br>• ආරම්භය<br>• ව්‍යාප්තිය<br>• ප්‍රතිඵල | | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| රටක ජනතාව සාමූහික ව ක්‍රියා කිරීමෙන් ජයග්‍රහණ අත්පත් කර ගත හැකි බවට අවබෝධයෙන් කටයුතු කරයි | 6.1 අමෙරිකා මහාද්වීප තුළ යුරෝපා ශිෂ්ටාචාරය පැතිරගිය ආකාරය පරීක්ෂා කරයි<br><br>6.2 අමෙරිකා නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය විග්‍රහ | **6. අමෙරිකානු නිදහස් සටන**<br>● ජනපද බිහි වීම<br>- අමෙරිකාවේ මුල් පදිංචි කරුවෝ<br>- යුරෝපා ජාතීන් අමෙරිකාවට සංක්‍රමණය වීම හා ජනපද පිහිටුවීම<br>- උතුරු අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද<br>● නිදහස් සටන<br>- නිදහස් සටන සහ එහි ආරම්භය<br>- ජනපද වාසීන්ගේ ජයග්‍රහණයට හේතු<br>● නිදහස් සටනේ ප්‍රතිඵල | ● කාර්මික විප්ලවය ඇති වීමට තුඩු දුන් පසුබිම සහ නව සොයාගැනීම් පිළිබඳ ව විග්‍රහ කරයි<br>● කාර්මික විප්ලවයේ ප්‍රතිඵල පැහැදිලි කරයි<br>● කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කරයි<br>● අමෙරිකාවේ මුල් පදිංචි කරුවන් පිළිබඳ තොරතුරු විස්තර කරයි<br>● බ්‍රිතාන්‍යයන් අමෙරිකාවේ පිහිටුවා ගත් ජනපද පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි<br>● උතුරු අමෙරිකාවේ බ්‍රිතාන්‍ය ජනපද සිතියමක ලකුණු කරයි | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **නිදහස සහ මානව අයිතිවාසිකම් මහජන අරගලවල ප්‍රතිඵල බව අවබෝධ කරගෙන ඒවා ආරක්ෂාකර ගැනීමට කටයුතු කරයි** | **කරයි**<br><br>**7.1 සමාජයේ පැන නගින ගැටලු අවස්ථා නොසලකා හැරීමෙන් විප්ලව ගොඩ නැගෙන බව ප්‍රංශ විප්ලවය ඇසුරින් විග්‍රහ කරයි** | **7. ප්‍රංශ විප්ලවය**<br><br>• ප්‍රංශයේ ආදිතන්ත්‍රය<br>• ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු<br>• විප්ලවයේ ආරම්භය හා වර්ධනය<br>• විප්ලවයේ ප්‍රධාන අවස්ථා<br>• විප්ලවයේ ප්‍රතිඵල | • අමෙරිකා නිදහස් සටන විග්‍රහ කරයි<br>• අමෙරිකා නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය පැහැදිලි කරයි | **20** |

*12 වන ශ්‍රේණිය*

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| නූතන ලෝකයේ උදාවට බලපෑ ඓතිහාසික බලවේග පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 1.1 වාණිජ ධනවාදයේ නැඟීම නූතන ලෝකයේ උදාවට බලපෑ ආකාරය විග්‍රහ කරයි<br><br>1.2 ජාතික රාජ්‍යයන්ගේ නැඟීම නූතන ල්කයේ උදාව කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි | 1. නූතන ලෝකයේ උදාව<br>• වැඩවසම් ක්‍රමයේ පාරිහනිය හා වාණිජ ධනවාදයේ නැඟීම<br><br>• ජාතික රාජ්‍ය බිහි වීම | • ප්‍රංශ විප්ලවයට හේතු පැහැදිලි කරයි<br>• ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා විස්තර කරයි<br>• ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල විග්‍රහ කරයි<br><br>• වාණිජ ධනවාදය විග්‍රහ කරයි<br>• යුරෝපයේ වාණිජ ධනවාදයේ නැඟීම විස්තර කරයි<br>• වාණිජ ධනවාදයේ නැඟීම නූතන ලෝකයේ උදාවට බලපෑම පෙන්වා දෙයි<br><br>• ජාතික රාජ්‍ය බිහි වීමට හේතු පැහැදිලි කරයි<br>• යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍ය පිළිබඳ විස්තර කරයි<br>• යුරෝපයේ බිහිවූ ජාතික රාජ්‍යයන් සිතියමක ලකුණු කරයි<br>• ජාතික රාජ්‍ය බිහි වීම | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 හුදෙකලා ව පැවැති රටවල් ලෝකයට විවර වූ ආකාරය පෙන්වා දෙයි | • දේශ ගවේෂණ<br>- 16 වන සියවස වන විට ආසියා, අප්‍රිකා, අමෙරිකා මහ ද්වීපවල පැවති තත්ත්වය<br><br>• දේශගවේෂණ ව්‍යාපාර | නූතන ලෝකයේ උදාව කෙරෙහි බලපෑ ආකාරය පෙන්වා දෙයි<br><br>• 16 වන සියවස වන විට ආසියා, අප්‍රිකා හා ඇමෙරිකා මහාද්වීපවල පැවති තත්ත්වය පැහැදිලි කරයි<br><br>• යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරය ආරම්භ විමට හේතු පහදයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| නූතන ලෝකයේ උදාවට බලපෑ බලවේග පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | 2.1 යුරෝපයේ බලවත් රාජ්‍ය ලෝකය පුරා තම බලය ව්‍යාප්ත කළ ආකාරය විග්‍රහ කරයි | 2. යුරෝපා බලව්‍යාප්තිය හා අධිරාජ්‍ය ගොඩනැඟීම<br>• උතුරු හා දකුණු අමෙරිකාව<br>• ආසියාව<br>• අප්‍රිකාව | • දේශ ගවේෂණ ව්‍යාපාරය හා එහි ප්‍රතිඵල පෙන්වා දෙයි<br>• දේශ ගවේෂණ ව්‍යාපාරය සිතියමක ලකුණු කරයි<br>• යුරෝපා රටවල සෙසු මහාද්වීප කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි<br>• යුරෝපා රටවල් ලෝකයේ වෙනත් රටවල තම බලය ව්‍යාප්ත කළ ආකාරය පෙන්වා දෙයි<br>• යුරෝපා රටවල බලව්‍යාප්තිය | 35 |

